# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2019 ජූලි මස 12 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2019.07.15 දින නිකුත් කරන ලදී)**

# භාර ලදුපත් (සංශෝධන)

**(86 වන අධිකාරය වූ) භාර ලදුපත් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමියගේ නියමය පරිදි පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මෙම වගන්තිය මඟින්, (86 වන අධිකාරය වූ) භාර ලදුපත් ආඥාපනතේ 4 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ නොව 2019 අංක  දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත යටතේ ලියාපදිංචි කරනු ලබන භාර ලදුපත්වල නෛතික ප්‍රතිඵල පිළිබඳව විධිවිධාන සැලැස්වීම වේ.

***3 වන වගන්තිය*** : මෙම වගන්තිය මඟින්, ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ දැනටමත් ලියාපදිංචි කොට ඇති භාර ලදුපත් බලාත්මකව පවතින කාලසීමාව පිළිබඳව සහ 2019 අංක  දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමෙන් පසුව එම භාර ලදුපත් තවදුරටත් බලාත්මක කළ හැකි වීම සඳහා සහ ඒවායේ ප්‍රමුඛතාව තවදුරටත් බලපැවැත්වීම සඳහා එම භාර ලදුපත් එම පනත යටතේ ලියාපදිංචි කළ යුතු වීමේ අවශ්‍යතාවය පිළිබඳව විධිවිධාන සලස්වනු ලැබේ.

එල්.ඩී.—ඕ. 64/2017

## (86 වන අධිකාරය වූ) භාර ලදුපත් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.**

1. මේ පනත 2019 අංක     දරන භාර ලදුපත් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය අමාත්‍යවරයා විසින් *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන නියමයක් මඟින් නියම කරනු ලබන දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

**86 වන අධිකාරයේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.**

2. (86 වන අධිකාරය වූ) භාර ලදුපත් ආඥාපනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "භාර ලදුපත විකුණුම් බිල් පත්‍රයක් ලෙස ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ ලියාපදිංචි කරනු ලබන අවස්ථාවක" යන වචන වෙනුවට "භාර ලදුපත විකුණුම් බිල් පත්‍රයක් ලෙස 2019 අංක     දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත යටතේ ලියාපදිංචි කරනු ලබන අවස්ථාවක" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ ලියාපදිංචි කරන ලද භාර ලදුපත්වලට අදාළ විධිවිධාන.**

3. (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ විකුණුම් බිල් පත්‍රයක් ලෙස ලියාපදිංචි කරනු ලැබ ඇති භාර ලදුපතක් බලාත්මකව පවතින අවස්ථාවක දී, ඒ භාර ලදුපත මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට අවුරුදු දෙකක කාලසීමාවක් සඳහා තවදුරටත් බලාත්මක විය යුතු නමුත්, ඒ අවුරුදු දෙකක කාලසීමාව ඉකුත් වීමට පෙරාතුව එම භාර ලදුපත විකුණුම් බිල් පත්‍රයක් ලෙස 2019 අංක     දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනතේ අදාළ විධිවිධාන යටතේ ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් විකුණුම් බිල් පත්‍රයක් 2019 අංක     දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ විට එය මුලින්ම නීත්‍යානුකූලව බලාත්මක කළ හැකි විකුණුම් බිල් පත්‍රයක් බවට පත් වූ දිනයේ සිට පරිපූර්ණත්වයට පත් වූ ලෙසට සලකනු ලැබිය යුතු අතර, එම විකුණුම් බිල් පත්‍රය මුලින්ම නීත්‍යානුකූලව බලාත්මක කළ හැකි විකුණුම් බිල් පත්‍රයක් බවට පත් වූ අවස්ථාවේ දී හිමිකම් ලැබුවේ යම් ප්‍රමුඛතාවකට ද ඒ ප්‍රමුඛතාව තවදුරටත් බලපැවැත්විය යුතු ය.

(3) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට අවුරුදු දෙකක් ඉකුත් වීමට පෙරාතුව 2019 අංක  දරන සුරක්ෂිතලත් ගනුදෙනු පනත යටතේ ලියාපදිංචි කරනු නොලබන (1) වන උපවගන්තියේ සඳහන් විකුණුම් බිල් පත්‍රයක් එම කාලසීමාව ඉකුත් වීමෙන් පසුව නීත්‍යනුකූලව බලාත්මක කළ නොහැකි විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.